**ලංකාපුර ප්‍රාදේශීය සභාව - 2023**

**-------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ලංකාපුර ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ලංකාපුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

*මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.*

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ.

සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ** වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහජන බැංකුවේ අංක 23220010774487 දරන ඉතුරුම් ගිණුමේ පෙර වර්ෂයට අදාළව ලැබී තිබුණු පොලී රු.296,020 ක් සමාලෝචිත වර්ෂයේ පොලී ආදායම් ගිණුමට ගැලපීම නිසා සමාලෝචිත වර්ෂයේ පොලී ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | පිළිගෙන ඇත. | පොලී ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී දෙසැම්බර් 06 දින ලංකා බැංකුවේ ආරම්භ කරන ලද අංක 2300306 දරන ස්ථාවර තැන්පතුව සඳහා සමාලෝචිත වර්ෂයට අදාළව ලැබිය යුතු පොලී රු.117,123 ක් ගැලපීම් කර නොතිබුණි. | ජනල් අංක 02 මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාළ උසාවි දඩ ආදායම රු.10,649,801 ක් වුවත් එම ආදායම රු.5,545,611 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ආදායම රු.5,104,190 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි බිල් කළ ආදායම ලැබුන පසු ඇස්තමේන්තු ආදායම හා සත්‍ය ආදායම අතර වෙනස ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | නිවැරදි ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයට අදාළ මුද්දර ගාස්තු ආදායම රු.3,878,900 ක් විය යුතු වුවත්, මූල්‍ය ප්‍රකාශනවල එම ආදායම රු.1,624,267 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම රු.2,254,633 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි බිල් කළ ආදායම ලැබුන පසු ඇස්තමේන්තු ආදායම හා සත්‍ය ආදායම අතර වෙනස ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | නිවැරදි ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | මූල්‍ය ප්‍රකාශන අනුව තොගවල අඩුවීම රු.1,527,677 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයට අදාළව පිළියෙල කර තිබුණු මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ තොගවල වැඩිවීම රු.558,969 ක් ලෙස දක්වා තිබුණි. | පිළිගෙන ඇත. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයට අදාළව ගෙවිය යුතු විගණන ගාස්තු සඳහා ගැලපීම් කර නොතිබුණි. | පිළිගනිමි. ජ´නල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | ගිණුම් ප්‍රතිපත්තිය අනුව උපචිත පදනම මත ගිණුම් ඉදිරිපත් කළ යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිදේර්ශය** |
|---|---|---|
| මූල්‍යා ප්‍රකාශන තුළ ඉදිරිපත් කර තිබුණු ගිණුම් ශේෂ 06 ක ශේෂය හා මූල්‍යා ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු උපලේඛන අනුව ශේෂය අතර රු.2,892,462 ක නොසැසඳීමක් විය. | වසා ඇති ව්‍යාපාර ස්ථාන බලපත්‍ර ගාස්තු කර්මාන්ත බදු ආදායම තුළ ගිණුම් ගත වීම හා ජල විකුණුම් ආදායම තුළ ජල අධි ගාස්තු ඇතුළත් වීම නිසා බව දන්වා ඇත. | ගිණුම් හා උපයෝගී ලේඛන සසඳා නිවැරදිව මූල්‍යා ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| **විෂය** | **මුදල** | **නොසැපයූ විගණන සාක්ෂි** | **සභාවේ අදහස් දැක්වීම** | **නිදේර්ශය** |
|---|---|---|---|---|
| | **රු.** | | | |
| පිරියත | 2,731,115 | | අඩුපාඩු නිවැරදි කරමින් පවතින බව | ලේඛන යාවත්කාලීනව පවත්වා ගත යුතුය. |
| සවිකිරීම් | 15,715,888 | සමීක්ෂණ වාර්තා | | |
| යන්ත්‍ර උපකරණ | 18,928,266 | වට්ටෝරු ලේඛන | | |
| පරිගණක | 1,455,876 | | | |
| ලී බඩු | 7,500,932 | | | |
| | --------------- | | | |
| | 46,332,077 | | | |
| | ========= | | | |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිදේර්ශය** |
|---|---|---|---|
| 1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදල් පනත | 2019 දෙසැම්බර් මස සිට සභාවේ අනියම් සහ ආදේශක සේවකයින් වෙත ගෙවීම් කර ඇති වැටුප්වලට අදාළව සේවක භාරකාර අරමුදල වෙත යැවිය යුතු සියයට 03 ක දායක මුදල් සභාව විසින් ගෙවීම් කර නොතිබුණි. | කටයුතු කරන බව දන්වා ඇත. | අදාළ පනත අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍යා සමාලෝචනය

### 2.1 මූල්‍යා ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍යා ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ අයහාරය ඉක්ම වූ වියදම රු.11,789,264 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අයහාරය ඉක්ම වූ වියදම රු.6,624,736 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම් විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 858,400 | 607,190 | 807,650 | 408,850 | 681,900 | 165,000 | 165,000 | - |
| (ii) | කුලී | 20,554,415 | 18,281,261 | 18,918,650 | 1,980,844 | 18,560,707 | 17,329,003 | 16,574,036 | 2,618,233 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,147,560 | 348,787 | 458,487 | 220,600 | 1,169,100 | 1,386,323 | 1,056,023 | 330,300 |
| (iv) | වෙනත් ආදායම් | 4,412,260 | 4,409,484 | 4,258,623 | 643,629 | 4,820,020 | 3,485,248 | 2,992,480 | 492,768 |
| | | 26,972,635 | 23,646,722 | 24,443,410 | 3,253,923 | 25,231,727 | 22,365,574 | 20,787,539 | 3,441,301 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **කුලී** | | |
| (i) | 2023 දෙසැම්බර් 31 දිනට වර්ෂ 12 - 20 ත් අතර කාලයක සිට මස්කඩ 11 ක ගෙන් හිඟව පවතින එකතු වටිනාකම රු.1,350,308 ක් වූ මස්කඩ කුලී නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි. | අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව දන්වා ඇත. | නිරවුල් කරගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | වර්ෂ 10 කට අධික කාලයක සිට හිඟව පවතින මාළු ලෑලි හා සතිපොළ බදු කුලී ශේෂ 05 ක වටිනාකම රු.93,990 ක් නිරවුල් කර නොතිබුණි. | හිඟ අයකර ගැනීමට කටයුතු සිදු කරමින් පවතින බව | නිරවුල් කරගැනීමට කටයුතු කළ යුතුය. |
| (iii) | ලංකාපුර ප්‍රාදේශීය සභාවට අයත් කඩකාමර 40 ක් පවතින අතර, ඉන් කඩකාමර 09 ක් සමාලෝචිත වර්ෂයේදී නිෂ්කාර්යව පැවතුණි. | අදාළ කඩ කාමර බදු ගැනීම සඳහා බදු කරුවන් ඉදිරිපත් නොවීම නිසා බව | වත්කම් උපයෝජනය සඳහා කටයුතු කළ යුතුය. |
| (iv) | සමාලෝචිත වර්ෂයේදී කඩකාමර 39 ක් සඳහා රු.799,540 ක කුලී ගාස්තුවක් බිල්කර | කඩ කාමර තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව | තක්සේරු වටිනාකම් ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| ඇතත්, ඒ සඳහා කුලී තක්සේරු කරගැනීමක් සිදුකර නොතිබුණි. | මගින් ඉල්ලීම් කර ඇති බව | |
| **(ආ) බලපත්‍ර ගාස්තු**<br>2023 දෙසැම්බර් 31 දිනට වෙළඳ බලපත්‍ර කර්මාන්ත බලපත්‍ර හා ව්‍යාපාර බලපත්‍ර ලබා ගැනීමකින් තොරව බල ප්‍රදේශයේ පවත්වාගෙන ගොස් තිබුණු ආයතන 489 කින් රු.408,550 ක හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව | හිඟ ආදායම් අයකර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) ක්‍රියාකාරී සැලැස්ම**<br>වාර්ෂික අයවැය අනුව සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් 19 ක් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර නොතිබුණු අතර, වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මේ දක්වා තිබුණු කර්තව්‍යයන් 22 ක් අතරින් සමාලෝචිත වර්ෂය තුළදී ඉටුකර තිබුණේ කර්තව්‍යයන් 07 ක් පමණි. | ප්‍රජා සංවර්ධන නිලධාරී තනතුරේ රාජකාරී ඉටු කිරීම සඳහා සංවර්ධන නිලධාරීවරයකු නොමැති බැවින් අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වී ඇති බව | අපේක්ෂිත ඉලක්ක සපුරාගැනීම සඳහා කටයුතු කළ යුතුය. |
| **(ආ) අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**<br>සභා බල ප්‍රදේශයේ විද්‍යුත් පුස්තකාල 03 ක් ඉදිකිරීම සඳහා රු.9,392,385 ක් වැයකර අදාළ ගොඩනැගිලි ඉදිකර ඒ සඳහා වටිනාකම රු.2,302,032 ක් වූ උපකරණ ලැබී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අපේක්ෂිත කාර්යයන් ආරම්භ කිරීමට අපොහොසත් වී තිබුණි. | යෙදවීමට දැනුම ඇති නිලධාරීන් හා අදාළ මුර කරුවන් නොමැති වීම නිසා ආරම්භ කිරීමට නොහැකි වී ඇති බව | වත්කම් උපයෝජනය සඳහා කටයුතු කළ යුතුය. |

### 3.2 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන ජල ව්‍යාපෘති 03 ක් මගින් සමාලෝචිත වර්ෂය තුළදී ආදායම වශයෙන් රු.1,499,018 ක් ඉපයීමේදී ඒ වෙනුවෙන් දරා තිබුණු වියදම රු.2,002,005 ක් (ක්ෂය වියදම් හැර) වූයෙන් සමාලෝචිත | බල ප්‍රදේශයේ පානීය ජලය හිඟ ගම්මාන කිහිපයක් සඳහා ප්‍රාදේශීය සභාව මගින් ජලය ලබා දීම සිදු කරනු ලබන අතර පානීය ජලය ලබා දීම ප්‍රාදේශීය සභාව | මෙහෙයුම් අලාභය අවම වන ලෙස කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| වර්ෂයේදී මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ මෙහෙයුම් අලාභය රු.502,987 ක් විය. | වෙත පැවරී ඇති කාර්යයක් බැවින් ජල සේවාව සැපයීම සිදු කරනු ලබන බව දන්වා ඇත. |

### 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශිය සභාවට අයත් තඹාල සතිපොළ සංවර්ධනය කිරීම සඳහා 2021 වර්ෂයේදි කොන්ත්‍රාත් කරුවකු සමඟ රු.17,761,650 ක මුදලකට ගිවිසුම් ගතවී තිබුණු අතර රු.3,552,328 ක අත්තිකාරම් මුදලක් ගෙවීම් කර තිබුණද, කොන්ත්‍රාත්කරු විසින් අදාළ ඉදිකිරීම් සිදු නොකිරීම හේතුවෙන් සභාවට සිදුවී තිබුණු රු.2,711,283 ක අලාභයෙන් රු.1,554,515 ක මුදලක් නිරවුල් කරගෙන නොතිබුණි. | අලාභය අය කර ගැනීම සඳහා අදාළ කොන්ත්‍රාත්කරු සමග ගිවිසුමකට අත්සන් තබා ඇති අතර හිඟ මුදලින් රු.450,000.00 මුදලක් අයකර ගැනීමට කටයුතු කර ඇති බව දන්වා ඇත. | අය කරගැනීම සඳහා නීත්‍යානුකූලව කටයුතු කළ යුතුය. |

### 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විවිධ ව්‍යාපෘති යටතේ ශක්‍යතා අධ්‍යනයකින් තොරව සහා බල ප්‍රදේශයේ ස්ථාපිත කර තිබෙන හා ලබාදී ඇති පහත සඳහන් වත්කම් නිෂ්කාර්යව පැවතුණි. | පහත සඳහන් හේතුන් මත නිෂ්කාර්යව පවතින බව දන්වා ඇත. | වත්කම් ස්ථාපිත කිරීමට පෙර අවශ්‍යතාවය හඳුනාගත යුතුය. |

| වත්කම් විස්තරය | වටිනාකම රු. | නිෂ්ක්‍රීය කාලය | සභාවේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| තල්පොත බස්නැවතුම්පොළ | 2,230,568 | අවු. 07 | බස් නොපැමිණීම. |
| සහල් පිටි නිශ්පාදන බේකරි උපකරණ | 541,000 | අවු. 03 | භාවිතා නොකරයි. |
| තල්පොත සතිපොළ ගොඩනැගිල්ල | 2,377,452 | අවු. 01 | වෙළඳුන් නොපැමිණීම. |
| කාබනික පොහොර නිෂ්පාදන යන්ත්‍රය | 88,000,000 | අවු. 02 | පිරිවැය අඩු ක්‍රමවේද භාවිතා කරන බව |

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (ආ) | පිබිදෙමු පොළොන්නරුව ව්‍යාපෘතිය යටතේ රු.25,100,072 ක් වැයකර ඉදිකර ලංකාපුර ප්‍රාදේශීය සභාව වෙත භාරදී ඇති පුලතිසි ස්වර්ණ මණ්ඩප ගොඩනැගිල්ල සමාලෝචිත වර්ෂයේදී ඌන උපයෝජිතව පැවතුණි. | මුදල් අයකිරීමකින් තොරවද බල ප්‍රදේශයේ පවත්වනු ලබන විවිධ පොදු උත්සව කටයුතු සඳහා අවස්ථා කිහිපයකදී ලබා දී ඇති බව දන්වා ඇත. | උපයෝජනය සඳහා කටයුතු කළ යුතුය. |

**3.5 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද ප්‍රසම්පාදනයන්ට අදාළව ප්‍රසම්පාදන තීරණ ඇතුළත් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | 2024 වර්ෂයේ සිට නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | ප්‍රසම්පාදන ලේඛනයක් නඩත්තු කළ යුතුය. |

**3.6 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විගණනය වෙත ඉදිරිපත් කළ තොරතුරු අනුව සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩල තොරතුරු අනුව පුරප්පාඩු 13 ක් පැවතුණි | යෙදවීමට ප්‍රමාණවත් රියදුරු සංඛ්‍යාවක් නොමැති බැවින් අනියම් කාර්ය මණ්ඩලය රියදුරු තනතුරේ රාජකාරි සඳහා යොදවා ඇති බව | පුරප්පාඩු සම්පූර්ණ කරගැනීම සඳහා කටයුතු කළ යුතුය. |

**3.7 වාහන පද්ධතිය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1993 පෙබරවාරි 28 දින ලංකාපුර ප්‍රාදේශීය සභාවට ප්‍රධාන අමාත්‍යාංශය මගින් ලබාදී තිබූ අංක 53-5059 මිට්ෂුබිෂි කැබ් රථය සභාව නමින් පවරාගෙන නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |